තලවකැලේ ලිඳුල නගර සභාව
නුවරඑළිය දිස්ත්‍රික්කය
-----------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 අප්‍රේල් 11 දිනද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 මැයි 29 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
---------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට තලවාකැලේ ලිඳුල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
---------------------------------------------

විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම
-----------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු. 2,425,000 ක් වූ ගිණුම් විෂයයක් සහ වටිනාකම රු. 6,939,495 ක් වූ ජ'නල් සටහන් 02 කින් සමුච්චිත අරමුදලට වූ රු.345,165 ක ශුද්ධ බලපෑම තහවුරු කෙරෙන සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ශේෂයන් තහවුරු කිරීමේ සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ජ'නල් සටහන් මඟින් කර්මාන්ත ණය ගැතියන් හා ණය හිමියන්ට ගැලපීම් කර ඇත. |

(අ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(i) ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වසර 02 සිට වසර 15 දක්වා කාල පරාසයක් ගත වී ඇති රු.1,633,428 ක්වූ කර්මාන්ත ණයගැති ශේෂයන් අයකර ගෙන නොතිබුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගත යුතුවේ. | ණයගැතියන් දැනුවත් කර ඇති අතර මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කරමි. |

(ii) ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 02 සිට වසර 07 දක්වා කාල පරාසයක් ගතවී ඇති රු.818,775 ක ගෙවිය යුතු ගිණුම් ශේෂ 05 ක් නිරවුල් කර නොතිබීම. | ගෙවිය යුතු ශේෂ ගෙවා නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | සුදුසු ආකාරයට නිරවුල් කිරීමට කටයුතු කරමි. |

1.4 අනුකූල නොවීම්

1.4.1 නීති ,රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- | --- |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 189 හා 486 | රු. 557,217 ක් වටිනා අගරු චෙක්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අදාළ චෙක්පත් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා කටයුතු කර ඇත. |
| (ආ) | මුදල් රෙගුලාසි අංක 396 (ඇ) | රු.16,080 ක් වටිනා නිකුත්කර මාස 06 ඉක්ම වූ චෙක්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අදාළ ආදායකයින් දැනුවත්කර තවදුරටත් නිශ්කාශනය නොකරන චෙක්පත් තැන්පත් ගිණුමට මාරුකිරීමට කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | මුදල් රෙගුලාසි 570 සහ 571 | තැන්පත් කර වසර 02 ඉක්ම වූ, රු.78,378 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉකුත් වූ තැන්පතු නියාදනය කිරීමට කටයුතු කරමි. |
| (ඈ) | 2000 අංක 53 සහ 1988 අංක 56 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ බලපවත්වන ලද රෙගුලාසිවලට අනුකූලව නිකුත් කර ඇති 2008 ජනවාරි 25 දිනැති අංක 1523/ 16 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය | වලංගු කාලය අවසන්වී තිබුණු ව්‍යාපාර 03 ක් සඳහා නව පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත්කර නොතිබුණි. | ව්‍යාපාර පිළිබඳ සමීක්ෂණයක් සිදුකර පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කළයුතු වේ. | බලපත්‍ර 02 ක් සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරියෙන් ලබාදෙන පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ආකෘති සභාවේ නොමැති අතර අනෙක් බලපත්‍රය සම්බන්ධයෙන් ව්‍යාපාරිකයා දැනුවත් කළ නමුත් එය ලබාගැනීමට කටයුතු නොකරන බැවින් නීත්‍යානුකූලව කටයුතු කරමි. |

2. මූල්‍ය සමාලෝචනය
------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.10,096,333 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.8,777,807 ක් විය.

2.2 මූල්‍ය පාලනය
-----------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නගර සහා ආඥාපනතේ (255 අධිකාරිය) 158 (4) උප වගන්තිය ප්‍රකාරව අතිරික්ත මුදල්, අනුමත සුරැකුම්පතක ආයෝජනය කළ යුතු වුවද, වර්ෂය පුරාම රු.12,000,000 කට අධික මුදලක් එසේ ආයෝජනය නොකර ජංගම ගිණුම් 02 ක රඳවාගෙන තිබීම. | අනුමත සුරැකුම් පතක ආයෝජනය කර ආදායමක් උපයාගැනීමට කටයුතු කළ යුතුවේ. | අදාළ මුදල් කඩිනමින් සංවර්ධන කාර්යයන් වෙත ආයෝජනය කිරීමට 2019 වර්ෂයට අදාළව ඇස්තමේන්තු සකසා ඇත. |
| (ආ) | 2018 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශනයේ උපලබ්ධිනොවූ ලැබීම් ලෙසට 1993 වසරේ සිට ඉදිරියට ගෙන එන | මේ සම්බන්ධයෙන් සොයාබලා නිරවුල් කරගැනීමට කටයුතු | මෙම ශේෂය සම්බන්ධව පැහැදිලි සාක්ෂි නොමැති අතර නිරවුල් කරගැනීම සඳහා විගණනයේ උපදෙස් |

| | | |
|---|---|---|
| රු.410,726 ක ශේෂය නිරවුල් කර නොතිබීම. | කළ යුතුවේ. | අපේක්ෂා කරමි. |

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 6,612,500 | 5,480,131 | 4,375,708 | 3,395,510 | 6,125,034 | 5,805,627 | 5,495,110 | 3,144,513 |
| කුලී | 7,529,289 | 9,071,720 | 7,499,718 | 5,716,044 | 4,035,600 | 5,054,607 | 4,742,083 | 1,447,396 |
| බලපත්‍ර ගාස්තු | 1,331,000 | 857,000 | 857,000 | - | 1,650,000 | 828,390 | 828,390 | - |
| වෙනත් ආදායම් | 10,631,986 | 1,675,917 | 1,626,429 | 8,919 | 3,810,000 | 3,621,251 | 2,926,909 | 3,433,774 |
| | 26,104,775 | 17,084,768 | 14,358,855 | 9,120,473 | 15,620,634 | 15,309,875 | 13,992,492 | 8,025,683 |

2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

| | | |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති රු 4,618,850 ක්වූ වරිපනම් බදු ,කඩකුලී, ගෙවල් කුලී , සතිපෙළෙ ගාස්තු, බිම්බදු, හා සාප්පු සංකීර්ණ ගාස්තු හිඟයෙන් වර්ෂය අවසාන වනවිට රු.858,500ක් පමණක් අයකර තිබුණු බැවින් හිඟ ආදයම් අය කිරීම සතුටුදායක නොවීය. | හිඟ ආදයම් අයකර ගැනීම සම්බන්ධයෙන් නගර සභා ආඥා පනතේ විධිවිධාන අනුව කටයුතු කිරීම. | අදාළ හිඟ මුදල් 2019.06.30 දිනට පෙර අයකර ගැනීමට කටයුතු කරන බව. |

2.3.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

(අ) උසාවි දඩ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.1,854,826 ක උසාවි දඩ හා රු.858,500 ක මුද්දර ගාස්තු අයකර නොතිබුණි. | අදාළ මුදල් සභාව අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | අදාළ අංශ වෙත ලිපි යවා කඩිනමින් එම මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1. කාර්ය සාධනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කාර්තවයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ). ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| නගර සභා බල ප්‍රදේශයේ දෛනිකව එකතුවන කසළ ප්‍රමාණය ටොන් 4.5 ක් පමණවුවද, ඉන් සියයට හැටක් පමණ මිශ්‍ර කසළ වන බැවින් එයින් කොම්පෝස්ට් අංගනය වෙත යොමුකරන ප්‍රමාණය සතුටුදායක මට්ටමක නොපැවතීම. | පරිසරයට හානියක් නොවන ආකාරයෙන් අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු සිදු කිරීම. | කසළ වෙන් කර ලබාදෙන ලෙස ප්‍රදේශවාසීන් දැනුවත්කර ඇති අතර කසළ වෙන්කර ලබාගන්නා ලෙස සහා සේවකයින්ද දැනුවත්කර ඇත. |

(ආ). තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක පිළිබඳව නගර සභාව ප්‍රමාණවත්ව | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක සපුරා ගැනීමට සැලසුම් | පිළිතුරු ලැබී නොතිබුණි. |

| | | |
|---|---|---|
| දැනුවත්වී නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය තුලදී ඒ සම්බන්ධයෙන් නිශ්චිත කාර්යයන් ඉටුකර නොතිබීම. | සකස් කළ යුතුවේ. | |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා
-------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පෙර වර්ෂවලදී කඩ කාමර බදු දී තිබුණු බදුකරුවන් 05 දෙනෙකුගෙන් අයවිය යුතු රු.304,607 ක හිඟ බදුකුලී අයකරගෙන නොතිබීම. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදාළ නඩු තීන්දු සභාවේ නොමැති බැවින් නඩු තීන්දු අධිකරණයෙන් ලබාගත් පසු ඒ අනුව කටයුතු කරමි. |
| (ආ) | තලවකැලේ පොදු බස්නැවතුම්පලේ පිහිටි ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය හා මගී ප්‍රවාහන අධිකාරිය විසින් පරිහරණය කරන කඩ කාමර 05 ක් සඳහා අයවිය යුතු රු.890,400 ක් අයකරගෙන නොතිබීම. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම මුදල් අයකර ගැනීමට මැදිහත්වන ලෙස ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපති වෙතින් ඉල්ලීමක් කර ඇති අතර ඒ අනුව මෙම මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | සභාව සතු කැබ් රථය 2018 ජනවාරි 14 දින සිට අක්‍රියව පැවති අතර අළුත්වැඩියාකර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු නොතිබුණි. | අළුත්වැඩියාවට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුවේ. | මෙම රථය වෙන්දේසි කිරීම සඳහා මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් වෙත තොරතුරු යවා ඇති බව |

3.3 මානව සම්පත් කළමනාකරණය
-----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ තනතුරු 10 ක පුරප්පාඩු 24 ක් පැවතුණි. | අදාළ පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුවේ. | මේ පිළිබඳව පළාත් පාලන කොමසාරිස්වරයා දැනුවත් කර ඇත. |

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස්ගේ 2016 මාර්තු 17 දිනැති අංක මප/ප.පා.කො/2016/3 දරන චක්‍රලේඛයට පටහැනිව සභාව සතු පොදු වෙළඳපල පිහිටි කඩ කාමර 30 ක් සඳහා 2007 වර්ෂයේදී තක්සේරු කරන ලද කුලිය පදනම් කරගෙන 2018 වර්ෂය සඳහා කුලී අයකර තිබීම | අදාළ චක්‍රලේඛයේ විධිවිධාන අනුව මාසික කුලිය සංශෝධනය කළ යුතුවේ. | නව තක්සේරු කටයුතු ප්‍රමාද බැවින් පැරණි තක්සේරුව යටතේ ගිවිසුම් අළුත්කිරීමට බදුකරුවන් වෙත දැනුම්දී ඇත. |